

# සේකර

**ප්‍රේමවංශ දසනායක**

ලියූ වදන කවියක් විය
හද පතුලට එබී බලන
ඇඳි රේඛා සිතුවම් විය
සිය දහසක් වදන් කියන

ගුවන තිරය කරලිය මත
ඇසුන ගීත හද නැලවිය
සියලු කලා ශිල්ප නිපුන
හෙල මහ කවියා ඔහු විය

අකුරු අමුණා ගෙතූ පද වැල කවක් විය හද පතුල රඳනා
කුරුටු ගෑ ඉරි කැබලි එකතුව සිතුවමක් විය දෑස බඳිනා
තිරය කරලිය ගුවන මත දිග හැරුණ ගී ජීවයෙන් පිරුනා
අසම සම ප්‍රතිභා ප්‍රභාවය දෙරණ පෑ හිරු ලෙසින් දිලුනා

සිටින නිවහන යනෙන මඟ තොට සියලු තැන කවි වරම ලැබුවා
නෙතට හසුවුන සියලු දෑ අන් කෙනෙකු නොදකින විලස දුටුවා
දිනුව මව්බිම බැඳුන සෙනෙහස ගලා ගොස් හෙල දෙරණ තෙමුවා
දිවිය මරණය එකට මුසුකොට පවර සිතිවිලි අවදි කෙරුවා

ඉහල අහසේ පොලෝ තලයේ විහිද ගිය කවි කල්පනාවේ
සිහින ලොව හා පියවි ලොව එක රන් හුයක ගැට ගසා තැබුවේ
සයුර ඇල දොල සැලෙන ගහ කොළ පවන සිප හඬ නගන රාවේ
සනිටුහන් විය සවන කොඳුරා ගැයූ ගීයක මිහිරියාවේ

සිදාදිය හැර දමා ගම බිම සොයා පැමිණිය සොඳුරු ගමනේ
රටා වියු අත ලතා මැවු නෙත කලා කෙත උරුමයයි ලැබුනේ
සදා දිදුලන කුසලතා නිර්මාණ මල් ගොමු පිපී වැනුනේ
සොබා දහමේ මහඟු නිමැයුම කලා කරුවා කියන ලෙසිනේ

# අසංවර

**නයනසේන වන්නිනායක**

කෝටියක් සංවර සීල
සමාදන් වී බැතියෙන
දැල්වූ හිත් පහන
මියැදිලා පහන්පැළ මතම
රස්තියාදු සුළඟට

මේ හැන්දෑ යාමේ
අවලං හිරිකඩ
සක්මන් කරයි දොරකඩ
ලියන කවි පේළිද
කිටි කිටි ගා ගැහෙන

තොල් සිපගන්නට අහන
මා හිතවතිය මදුවිත
ඔච්චම් කරනු ඇයි
වයස නොමදත්
අසංවර පෑනට.




# ගිණුම වසා ඇත...

**ප්‍රනීත් කාරියවසම්**

දිගන්තය අතීර දා වසන්තය
පැටලිලා දුටු හීන නිලන්තය
ඉගිලිලා දුර ගිහින් අතීතය
ග්‍රීෂ්මය අළුකලා වසන්තය

පිපුනාට සිනා පිරි ඇරඹුම
යන ගමනෙ රළු බොරලු ඇනුනම
අමනාප ඔය වුවන දුටුවම
නෙත කඳුළු ඉනුවෙ මට නොදැනිම

උදා සළු රිවි කිරණ එලුවට
දවාලක ගිනි දවයි සළු පට
නිශා කල සිතිජයට එබුනට
එකම හිරු අපේ දුක සතුටට

නුඹ නිසා දුටු හීන බෝමයි
පියෙවි ලොව දසුන් අඩමානයි
කදෝපැණි රිවි දුටුව සේමයි
තේරුනේ දෙනෙත් ඇරුනාමයි

ඇල් පවන මුව සිපින වටාපත
විඩාබරිතව පසෙක වැටී ඇත
වල දමා උපන් ගෙයි සෙනේ සිත
මගෙ නමට ඔබෙ ගිණුම වසා ඇත..



**ආශා ඩී පෙරේරා**

මේ විසල් අහස නුඹ..... වෙන සසැඳුමට කිසිත් නැති
හිරු සඳුට තාරුකා
මතු නොව
පොළොවට පෙම් බැඳි
තටු අහිමි සමනළුන්ටත්
මග කියාදුන්න නිසි
විශ්වයම අතැඹුලක් සේ
නුඹ
පාමුල දුටුවෙමි

මහ මෙරක් වගේ නොසැලුණු මුදු
සඳක සිසිල ඇති
නුඹ එලිය උනේ
පහන වගේ
දෙවොළට නුඹ හිමි
මහ පොළොව වගේ
හන්ගාගෙන
හදෙහි දැවෙන ගිනී
අපෙ මුවේ සිනා මල්
පිබිදූ
සෙනෙහස අරුමෙකී

සදා හරිත වන අරණට මන් පෙත් සදමින් නුඹ දැරූ නේක පීඩා දිය
උල්පත් සොයමින් මහ වනස්පතිය නුඹ සෙවණෝ
සිහිලස ලබමින්
සිටි කුරුල්ලන්ට ඉගිල්ලෙන්න
අවසරයී ඉතින්

# ජනේරුව හෙවත් ඇරඹුම හෝ අවසන

**මංජුල වෙඩිවර්ධන**

ළමැද්දට අත තියා හිත සොයන
වැරැද්දට ස්නේහය ම විසිකරන
පුරුද්දට අත් අකුරු වැසි වසින
දුරුත්තට කවි ලියා තනි රකින

කඳුළු විලිලන සොඳුරු මඳහසක
පතුළ විනිවිද දකින හදවතක
අතුළ හැඟුමන් ගෙනෙන පියපතක
විසිර ඇත කඳුළුබිඳු සියවසක

ගිරව්යක ගොළු වුණොත් පව් නැද්ද
කෙතරම්ද දුක මිදුණ නිස්සද්ද
පිනි බිඳිති හිමිදිරියෙ ඇහැරෙද්ද
කළුපැහැති වුණෝතින් කිරි ඉද්ද

මෙය මගෙ හදයි එයට පිවිසෙන්න
බය නැතුව පය තියා ඇවිදින්න
පය රිදෙයි නම් පසෙක ඉඳගන්න
නිය තුඩින් කවියකට ඇහැරන්න

ජනේරුව ඇරඹුමද අවසනද
පෙනේ නොපෙනෙන ඇසක නිදිවැරුම
දැනේ නම් සසලබව පද අතර
සෙනේහය ඇද හැලෙයි ඇස පිපිර

කවි සිළුමිණෙන් ඇසෙන කවියකට
කවුළු දොර අරින්නට ඉඩ නොදෙන
කවුරුවත් නොවෙයි මේ මඳ පවන
කවුළු දොර පියන් මත ඇණ ගසන

සදාදර අනන්තය අත ගාව
පියාඹන සිතුම් තටු අතගෑව
මලානික කවියකට අත පෑව
සිනාසෙන කඳුළුබිඳු දුටුවාද

(ඇහැළ ඇමතුමකට ඇහැරෙමි * 2011)



**රසිකා ගුණවර්ධන**

ඔබට නොවැටහේ
සුළඟක්ව පැමිණ
ඔබේ කෙහෙරැළි අවුල් කර ඇමුවේ
මා වෙන්ට පුළුවන් බව
මන්ද යත් .........
මා සුළඟ මෙන් පැතිර පවතිනාතර
හසු නොවී පැන යන්ට හපනෙක් බව
මුහු නොවී පවතින්ට රිසි බව
එහෙත් මා
ඔබ වටා පැතිර පවත්නා බව